මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
மனிதவலு மற்றும் வேலைவாய்ப்புத் திணைக்களம்
Department of Manpower & Employment

# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT
# 2016

**Department of Manpower & Employment,**
9th Floor, Sethsirirpaya (Second Phase),
Battaramulla.

## මිනිස්බල හා රැකීරක්‍ෂා දෙපාර්තමේන්තුව

# කාර්‍ය සාධන වාර්තාව
# 2016

**මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව**
9 වන මහල, සෙත්සිරිපාය II වන අදියර,
බත්තරමුල්ල.

**කාර්ය සාධන වාර්තාව - 2016**

**මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව**
9 වන මහල, සෙත්සිරිපාය II වන අදියර,
බත්තරමුල්ල.

මුද්‍රණය :-
ප්‍රින්ටෙක් එස්ටැබ්ලිෂ්මන්ට් පුද්ගලික සමාගම
52/1, එක්වත්ත පාර, මිරිහාන, නුගේගොඩ.
දුරකථන - 011 2815813/ විද්‍යුත් තැපැල - sales@printec.lk
වෙබ් අඩවිය - www.printec.lk

## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කම්කරු අමාත්‍යවරයා වශයෙන් මා හට පැවරී ඇති වගකීම ඉතා විශාල බව තරයේ විශ්වාස කරමි. කම්කරු ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා හැකි සෑම අයුරින්ම සේවය කිරීම මාගේ අධිෂ්ඨානයයි.

ශ්‍රී ලංකාව තුළ වර්ධනය වෙමින් පවතින නවීන වැඩ ලෝකය සඳහා විශේෂයෙන්ම තරුණ ප්‍රජාව ඇතුළු සමස්ත ශ්‍රම බලකායෙහි සහභාගීත්වය ඵලදායී ලෙස වැඩි කිරීම මූලික කරගත් විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් සිටින්නෙමු. එහිදී මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සහ සහයෝගය බෙහෙවින් අත්‍යවශ්‍ය වනු ඇත.

අනාගත ශ්‍රම බලකාය වෙත එකතු වන්නාවූ පාසල් දරුවන්ගේ සිට වෘත්තීය මාර්ගෝපදේශ සේවා මඟින් අනාගත රැකියා ලෝකයට ප්‍රවිශ්ඨ වීමට සුදුසු නිපුණතා වර්ධනය කර ගැනීමට උපකාරී වීමත්, ශ්‍රම බලකායේ කුසලතා හා හැකියාවන් ඉහළ මට්ටමක පවත්වා ගැනීමත් රජයක් වශයෙන් අප ලබන්නා වූ විශාල ජයග්‍රහණයකි.

එමෙන්ම ස්වයං රැකියා අපේක්ෂිතයින්, ආර්ථික වශයෙන් අවිද්‍යාවට ලක් වූ පුද්ගලයන් ආදී හඳුනාගත් ඉලක්ක ගත කණ්ඩායම් වෙත රැකියා නිර්මාණය තුළින් ඔවුන් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කිරීමට හා රටේ රැකියා විරහිත ප්‍රතිශතය අවම කිරීමට සපයනු ලබන දායකත්වය ඉතා විශාලය.

මෙරට ශ්‍රම බලකාය සඳහා එක් ප්‍රතිපත්තියක් මත පිහිටා නිසි අයුරින් මෙහෙයවීම මූලික වූ බැවින් ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය සකස් කර රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගණනාවක සහයෝගයෙන් ක්‍රියාත්මක කරනු ලබන අතර එම කර්තව්‍ය සම්බන්ධීකරණය කිරීමේ වගකීම ද මෙම දෙපාර්තමේන්තුව සතු වේ.

වර්තමාන රජයේ ප්‍රතිපත්තීන් වලට අනුකූලව "සෑමට රැකියාවක්" යන තේමාව යතාර්ථයක් බවට පත් කිරීම උදෙසා මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව සපයනු ලබන දායකත්වය මා බෙහෙවින් අගය කරනු ලබන අතර දෙපාර්තමේන්තුව වෙත මෙම කාර්යයන් වඩාත් සාර්ථකව ඉටු කිරීම සඳහා ශක්තිය ලැබේවායි සුභාශිංසනය ගෙන එමි.

## ලේකම්තුමන්ගේ පණිවුඩය

වර්ෂ 2010 දී කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලද මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ශ්‍රම බලකාය වෙත එකතු වන්නා වූ ශ්‍රී ලාංකීය තරුණ ප්‍රජාවගේ අභිවෘද්ධිය සඳහා තම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන දෙපාර්තමේන්තුවකි.

ඒ යටතේ ශ්‍රී ලාංකේය ශ්‍රම බලකාය නවමු මුහුණුවරකින් සහ ගෝලීය රැකියා අවශ්‍යතාවන්ට ගැලපෙන අයුරින් සකස් කිරීම උදෙසා පාසල් මට්ටමේ සිට විශ්ව විද්‍යාල මට්ටම දක්වා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම තම ප්‍රධාන කර්තව්‍යයක් ලෙස ඉටු කරනු ලබයි.

එසේම රැකියා ලොවට පිවිසෙන තරුණ ප්‍රජාවගේ පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම, මෘදු කුසලතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා වෘත්තීය පුහුණු ආයතන වෙත යොමු කිරීම මෙන්ම රැකියා අවස්ථා සඳහා එම පුහුණු ශ්‍රමිකයන් යොමු කිරීමද අප දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන ප්‍රමුඛ කාර්යය භාරයකි.

දිවයින පුරා දිස්ත්‍රික් වශයෙන් ගොඩනගා ඇති රැකියා සේවා මධ්‍යස්ථාන හරහා රැකියා විරහිත තරුණ ප්‍රජාව රැකියා යෝජකයන් වෙත යොමු කිරීම සිදු කරනු ලබන අතර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා වඩා කාර්යක්ෂම ලෙස එම කාර්යය ඉටු කරලීමට කටයුතු සිදු කෙරේ. එමෙන්ම දෙපාර්තමේන්තුව විසින් පළාත් වශයෙන් පවත්වනු ලබන රැකියා පොළ වැඩසටහන ඔස්සේද රැකියා විරහිත තරුණ තරුණියන් හා සේවා යෝජකයන් මුණ ගැස්වීම සිදු කරනු ලබන අතර ඒ හරහා බොහෝ තරුණ පිරිසකට රැකියා අවස්ථා ලබා දීමට මෙම දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇති බව සතුටින් ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

රැකියා නිර්මාණය තුලින් ස්වයං රැකියා සඳහා දිරි දීම ඌන ආර්ථික මට්ටම් වල සිටින හා අවධානමට ලක්වූ ප්‍රජාවන් සඳහා අත්වැලක් ලබා දීමද මෙම දෙපාර්තමේන්තුව හරහා සිදු කරනු ලබන තවත් එක් වැදගත් කාර්යය භාරයක් වේ. ඒ හරහා තරුණ ව්‍යවසායකයන් රටට දායාද කිරීමට ද හැකියාව ලැබී ඇති අතර එමගින් රජයේ රැකියාවක් සොයා ගැනීම තම මූලික අභිප්‍රාය ලෙස සැලකූ තරුණ ප්‍රජාව නවමු මාවතකට යොමු කොට ලාංකීය සමාජය කොටු වී පැවති සංකල්ප යම්තාක් දුරටකට හෝ ඉවත් කිරීමට හැකිවීම දෙපාර්තමේන්තුවක් වශයෙන් අප ලැබූ විශාල ජයග්‍රහණයකි.

පාසල් මට්ටමේ සිට විශ්ව විද්‍යාල මට්ටම දක්වා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව දෙමාපියන් හා ගුරුවරුන් සඳහාද ශ්‍රම වෙළඳපොළ නව ප්‍රවනතා පිළිබඳ දැනුවත් කිරීමේ විශේෂිත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ශ්‍රම වෙළඳපළ තොරතුරු එක් රැස් කිරීම , විශ්ලේෂණය හා බෙදා හැරීම මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති එක් කාර්යය භාරයක් වන අතර වාර්ෂිකව විශ්ලේෂණය කරනු ලැබූ දත්තයන් එම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් සහ මුද්‍රිත පිටපත් ලෙස ලාංකීය සමාජය වෙත මුදාහැරීම සිදු කරනු ලබයි.

ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්ති සකස් කොට ක්‍රියාත්මක කිරීමද මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති සුවිශේෂී වූ කාර්යය භාරයකි. ඒ යටතේ , නව රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුකූල වන සේ 2016 වර්ෂය තුළදී නැවත සම්පාදනය කරන ලද එම ප්‍රතිපත්ති අමාත්‍ය මණ්ඩල

අනුමැතිය සහිතව රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගණනාවක සහයෝගය සහිතව ක්‍රියාත්මක කරනු ලබයි.

රජයේ දෙපාර්තමේන්තුවක් වශයෙන් මෙම සියළු කාර්යයන් ඉතා සාර්ථකව ඉටුකිරීම හරහා ගෝලීය රැකියා වෙළඳපොලෙහි පවතින රැකියා අවස්ථා සඳහා ගැලපෙන පරිදි ශ්‍රී ලාංකීය මානව සම්පත සංවර්ධනය කිරීමේ කර්තව්‍යයෙහි ප්‍රමුඛතම කාර්යභාරයක් ඉටු කිරීමට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට හැකිවන බව අපගේ අපේක්ෂාවයි.

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

පුළුල් නිපුණතාවයෙන් යුත්, ක්‍රියාශීලී සහ ගෝලීය වශයෙන් තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩනැගීම සහ අපේ මානව සම්පත්වල මුළු ශක්තිය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීම යන මුඛ්‍ය එම පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා 2016 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවක් වශයෙන් අප ගත් ක්‍රියාමාර්ග සහ සැලසුම් ඉතා සාර්ථක වූ බව මාගේ හැඟීමයි.

පාසල් මට්ටමේ සිට විශ්වවිද්‍යාල මට්ටම දක්වා ළමා තරුණ ජන ගහණය අපගේ ඉලක්කගත කණ්ඩායම වන බැවින් ඔවුන් සඳහා විශේෂයෙන් සකසන ලද වැඩසටහන් මාලාවක් දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක වේ. ඒ යටතේ සාමාන්‍ය පෙළ හා උසස්පෙළ දරු දැරියන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් 3422 ක් සැලසුම් කළ අතර සැලසුම් කරන ලද ප්‍රමාණයද ඉක්මවා වැඩසටහන් 3712 ක් අප විසින් පැවැත්වීමට කටයුතු කෙරිණ. විශ්විද්‍යාල සිසුන් අනාගත රැකියා ලොවට පිවිසීමේ නව ප්‍රවණතා සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන්25 ක් අභ්‍යන්තර උපාධි අපේකෂකයින් මෙන්ම බාහිර උපාධි අපේක්ෂකයින් සඳහා ද පවත්වන්නට යෙදිණ. එම වැඩසටහන් තුලින් සාමාන්‍ය පෙළින් රැකියා ලොවට පිවිසෙන්නාගේ සිට විශ්වවිද්‍යාල මට්ටමින් රැකියා ලොවට පිවිසෙන්නා දක්වා ඔවුන්ගේ අනාගතය සැලසුම් කිරීම උදෙසා අවශ්‍ය වෘත්තීය පාඨමාලා , පුහුණු වැඩසටහන් මෙන්ම ගෝලීය රැකියා ප්‍රවණතා පිළිබඳව ද පුළුල් දැනුමක් ලබා දීම සිදු වේ.මේ හරහා රැකියා ලොවට අවශ්‍ය ආකාරයේ මානව සම්පතක් ගොඩනැගීම අපගේ මූලික අභිප්‍රාය වේ.

එතැනින් නොනැවතුණු අප රැකියා පොළ වැඩසටහන් හරහා සේවා යෝජකයන් හා රැකියා විරහිත තරුණ ප්‍රජාව එකිනෙකා මුණගැස්විම තුලින් විරැකියා තුළ ගොඩනැගුණු තරුණ අසහනය යම්තාක් දුරකට හෝ මැඩපැවැත්වීමට දායක වීමට හැකිවූ බව සතුටින් ප්‍රකාශ කරනු කැමැත්තෙමි.රැකියා පොළ වැඩසටහන හරහා වර්තමානයේ රැකියා වෙළඳපොළ පිළිබඳව යම් අවබෝධයක් තරුණ තරුණියන්ට යොමු කිරීමට ද හැකියාව ලැබිණ. එමෙන්ම රැකියා අපේක්ෂකයින් හා සේවා යෝජකයන් වෙබ් අඩවිය හරහා සෘජුවම අප හා සම්බන්ධ කර ගනිමින් අවශ්‍යතාවන්ට ගැලපෙන අයුරින් රැකියා සඳහා තරුණ තරුණියන් යොමු කිරීම ද පුහුණු අවශ්‍යතා පවතින තරුණ තරුණියන් පුහුණු වීම් ලබා දීමෙන් අනතුරුව රැකියා සඳහා යොමු කිරීමට ද වර්තමානයේ අපට හැකියාව ලැබී ඇත.

තරුණ තරුණියන් ස්වයං රැකියා සඳහා යොමු කිරීම තුලින් නව ව්‍යවසායකයින් රටට බිහි කිරීමටද දෙපාර්තමේන්තුවක් වශයෙන් අපට හැකියාව ලැබී ඇත. මේ හරහා කුඩා ව්‍යවසායකයින් ලෙස බොහෝ ප්‍රමාණයක් ව්‍යාපාර ලොවට පිවිසි අතර ඒ තුලින් නව සේවා යෝජකයින් බිහිවීම මඟින් නව රැකියා අවස්ථා උත්පාදනය වීම ද සිදු විය.

ලෝක මට්ටමේ ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් බිහිකිරීමට නම් ඔවුන්ට අත්වැල් සපයන්නන් දැනුවත් කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වේ. ඒ සඳහා දෙමාපියන් හා ගුරුවරුන් උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් 338 ක් දිවයින පුරා ක්‍රියාත්මක කෙරිණ. මේ හරහා දරුවාගේ දක්ෂතාව හඳුනාගෙන එම දක්ෂතාවන්ට ගැලපෙන පරිදි ඔවුන්ගේ අනාගතය නිර්මාණය කිරීමට අවශ්‍ය මූලික අඩිතාලම ලබා දීමට අපට හැකියාව ලැබිණ. සිය දරුවන් ඉංජිනේරුවන් , දොස්තරවරුන් කිරීමේ මානසිකත්වයෙන්

මිදී දරුවාගේ දක්ෂතාව අනුව විදුලි කාර්මික ශිල්පීන්, ලේඛකයන් , නිවාස සැලසුම් ශිල්පීන් වැනි රැකියා අවස්ථා සඳහා යොමු කිරීම තුල ද ඉහළ ආදායමක් ඉපයීමට හැකි බව පෙන්වා දීම මෙම වැඩසටහන් මගින් සිදු වේ.

අඩු ආදායම් ලාභී හා අවධානමට ලක් වූ ජනතාව සඳහා කණ්ඩායම් ගතව වැඩසටහන් සංවිධානය කිරීම තුලින් ඔවුන් ද වැඩ ලොවෙහි සක්‍රීය දායකත්වය සපයන්නන් බවට පත් කිරීමට අපට හැකියාව ලැබිණ. මෙලෙස අප දෙපාර්තමේන්තුව විසින් රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන වැඩටසහන් 507 ක් පවත්වා ඇති අතර 17641 ක් සඳහා එහි ප්‍රතිලාභ හිමි වී ඇත. වෘත්තීය මාර්ගෝපදේශ අංශය විසින් වැඩසටහන් 4309 ක් දිවයින පුරා පවත්වා ඇති අතර 135,527 ක් සඳහා එහි ප්‍රතිලාභ හිමිව ඇති බව සතුටින් ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

දිවයින පුරා ස්ථාපනය කර ඇති රැකියා සේවා මධ්‍යස්ථාන තුලින් රැකියා ගත කිරීම් 6089 ක් සිදු කර ඇති අතර පුහුණු වීම් සඳහා තරුණ තරුණියන් 2820 ක් යොමු කර ඇත. මේ අනුව විරැකියාව අවම කිරීම සඳහා අප ගත් ක්‍රියාමාර්ග සාර්ථක වී ඇති බව මාගේ හැඟීමයි.

ශ්‍රම වෙළඳ පොළ තොරතුරු ඒකකය යටතේ ලබා ගන්නා දත්තයන් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා මෙන්ම මුද්‍රිතව ද ලාංකීය සමාජය වෙත නිකුත් කරනු ලැබේ . එතුලින් රැකියා ලොවෙහි නව ප්‍රවණතා සම්බන්ධයෙන් සමාජය දැනුවත් කිරීම් , සිදු කරන ලද සමීක්ෂණ හා අධ්‍යයනයන්හි තොරතුරු ද සමාජගත කිරීම සිදු වේ. එම සමීක්ෂණයන්හි තොරතුරු දෙපාර්තමේන්තුවේ වැඩසටහන් සැලසුම් කිරීම සඳහා මෙන්ම නව වැඩසටහන් නිර්මාණය කිරීම සඳහා ද මනා පිටි වහලකි.

ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය සකස් කොට ක්‍රියාත්මක කිරීමද මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති සුවිශේෂී වූ කාර්යය භාරයකි. ඒ යටතේ , නව රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුකූල වන සේ 2016 වර්ෂය තුළදී නැවත සම්පාදනය කරන ලද එම ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගණනාවක සහයෝගය සහිතව ක්‍රියාත්මක කරනු ලබයි.

රාජ්‍ය ආයතනයක් ලෙස මෙම සියළු කාර්යයන් නොපිරිහෙලා ඉටු කිරීම පිණිස දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයෙන් ලැබෙන්නා වූ සහය ඉතා අගය කොට සලකමි.

තරඟකාරී වැඩලොව සඳහා ගැලපෙන්නාවූ මානව සම්පත් බිහිකිරීම උදෙසා කටයුතු කරන්නා වූ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනයක් ලෙස එම කාර්යය වඩා සංවිධිතව හා කාර්යක්ෂම ඉටු කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කිරීම අපගේ බලාපොරොත්තුවයි.

## පටුන


**1. හැඳින්වීම**

1.1 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

1.2 රාජකාරී ඉටු කිරීමේ විෂය පථය

1.3 උපාය මාර්ගික දිශානතිය

1.4 දෙපාර්තමේන්තුවේ ගමන් මඟ

1.5 දිර්ඝ කාලීන ඉලක්ක

1.6 දෙපාර්තමේන්තුවේ අරමුණු

1.7 දෙපාර්තමේන්තුවේ අංශ

**2. සංවිධාන ව්‍යුහය**

2.1 අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු 2016.12.31

2.2 මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරින්ගේ තොරතුරු සාරාංශය - 2016

**3. පාලන අංශය**

3.1 කාර්ය මණ්ඩල තොරතුරු

3.2 කාර්ය මණ්ඩලය පුහුණුව

3.3 මූල්‍ය පරිපාලන සාරාංශය - 2016

**4. රැකියා නිර්මාණ හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය**

4.1 රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

4.2 වෘත්තීය මාර්ගෝපදේශ අංශය

**5. මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය**

5.1 ශ්‍රම වෙළඳපල තොරතුරු ඒකකය

5.2 මහජන රැකියා මධ්‍යස්ථාන(PES)

5.3 දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහනෙහි ප්‍රගතිය

# 1. හැඳින්වීම

## 1.1 මිනිස්බල හා රැකීරක්‍ෂා දෙපාර්තමේන්තුව

2010.02.12 දිනැති අංක 1640/31 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව මිනිස්බල හා රැකීරක්‍ෂා දෙපාර්තමේන්තුව 2010 වසරේදී කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදි. වර්තමානයේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුව වෙත රාජ්‍ය රැකියා සේවාවන් පවත්වාගෙන යාම හා ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම ද පැවරී ඇත.

## 1.2 රාජකාරී ඉටු කිරීමේ විෂය පථය

**මෙම දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යන් ඉටු කරලීමට බලාපොරොත්තු වේ.**

- ජාතික මිනිස්බල හා රැකීරක්‍ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන කටයුතු
- වෘත්තීය මාර්ගෝපදේශනයට අයත් කටයුතු
- ශ්‍රම වෙළඳපල තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම
- රැකියා පියස (Jobs Net) මගින් සිදුකෙරෙන වෙනත් සේවාවන්

සහ ඉහත විෂයන්ට ආනුෂාංගික සහ සම්බන්ධිත සෙසු සියලු කටයුතු.

එසේම ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී මිනිස්බල හා රැකීරක්‍ෂා දෙපාර්තමේන්තුව වෙත ප්‍රධාන කාර්ය භාරයක් පැවරී ඇත

## 1.3 උපාය මාර්ගික දිශානතිය

<u>දැක්ම</u>

**ලෝක මට්ටමේ ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්**

<u>මෙහෙවර</u>

**පුළුල් නිපුණතාවයෙන් යුත්, ක්‍රියාශීලී සහ ගෝලීය වශයෙන් තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩනැගීම සහ අපේ මානව සම්පත්වල මුළු ශක්තිය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීම**

## 1.4 දෙපාර්තමේන්තුවේ ගමන් මඟ

2010 වර්ෂයේ පිහිටුවන ලද මෙම දෙපාර්තමේන්තුව මඟින් මේ දක්වා වෘත්තීය මාර්ගෝපදේශනයට හා රැකියා නිර්මාණ ප්‍රවර්ධනයට අදාළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් රාශියක් තුළින් ප්‍රතිලාභින් විශාල සංඛ්‍යාවකට ප්‍රතිලාභ ලබා දෙමින් මෙරට ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා රැකියා විරහිත තරුණ තරුණියන් හට පෞද්ගලික අංශයේ රැකියා ලබා දීම සඳහා කටයුතු කර ඇත.

## 1.5 දීර්ඝ කාලීන ඉලක්ක

ගෝලීය වශයෙන් පවතින තරඟකාරිත්වයන් හා අභියෝගයන් හමුවේ එම තත්වයට ගැලපෙන පරිදි හා ඊට අනුගත පරිදි ශ්‍රම බලකායක් සකස් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ මූලික වගකීම වේ. ඒ අනුව ලෝක මට්ටමේ ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් ඇති කිරීම දැක්ම කර ගත් මෙම දෙපාර්තමේන්තුවේ දිගුකාලීන ඉලක්ක පහත පරිදි වර්ගීකරණය කල හැක.

1. ගෝලීය වශයෙන් තරඟකාරී , නිපුනතාවයෙන් සහ බහුවිධ කුසලතාවයෙන් යුත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් ගොඩ නැංවීම
2. විරැකියාව අවම කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම
3. සංවිධිත පරිපූර්ණ ශ්‍රම වෙළඳපල තොරතුරු පද්ධතියක් ඇති කිරීම

## 1.6 දෙපාර්තමේන්තුවේ අරමුණු

ඉහත ඉලක්කයන් ඉටුකරගැනීම බලපැවැත්වන්නේ පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම තුළිනි.


1. ජාතික මිනිස්බල ප්‍රතිපත්තිය සකස්කර ප්‍රතිපත්තිය සහ අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. කුසලතා නොගැලපීම යන ව්‍යුහාත්මක සේවා වියුක්ති ගැටළුව විසඳීම
3. වර්තමාන ශ්‍රමබලකායට අයත් සහ අනාගතයේ ශ්‍රම වෙළඳපොළට එක්වීමට නියමිත සියලුම ශ්‍රී ලාංකිකයන් හට නිවැරදි වෘත්තීය දිශානතිය නිශ්චය කරගැනීම සඳහා පහසුකම් සැලසීම.
4. මිනිස්බල සැලසුම් කිරීම.සංවර්ධනය හා පුරෝකථනය ,
5. අවිධිමත් අංශය සංවර්ධනය.
6. පෞද්ගලික අංශයේ රැකියා සඳහා රැකියා අපේක්ෂකයින් පෙළඹවීම
7. නිදහස් රාජ්‍ය රැකියා සේවය ලබාදීම.
8. අවධානමට ලක්වී ඇති කණ්ඩායම් , ආබාධිත පුද්ගලයින් සහ ඌන සංවර්ධිත ප්‍රදේශ වල වෙසෙන පුද්ගලයින් සඳහා මිනිස්බල හා සේවා නියුක්තිය ආශ්‍රිත පහසුකම් සැපයීම.
9. ගෝලීය හා දේශීය වශයෙන් නිවැරදි ශ්‍රම වෙළඳපොළ තොරතුරු සියළුම ශ්‍රී ලාංකිකයන්ට ලබාදීම.
10. දේශීය හා ගෝලීය ශ්‍රම වෙළඳපොළ නැමියාවන් පුරෝකථනය

මේ අයුරින් විරැකියාවඅවම කිරීම හා යහපත් රැකියා ඇතිකිරීම යන සත්කාර්යයන් ඉටුකර ගැනීම උදෙසා මෙම දෙපාර්තමේන්තුව සිය මානව සම්පත් උපයෝගී කරගනිමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනුලබයි.

### 1.7 දෙපාර්තමේන්තුවේ අංශ

- පාලන අංශය
- ගිණුම් අංශය
- මිනිස්බල සැලසුම්,සංවර්ධන හා පර්යේෂණ අංශය
  - ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය
  - මහජන රැකියා සේවය
- රැකියා නිර්මාණ,ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය

## 2. සංවිධාන ව්‍යුහය




1. ග්‍රාමීය රැකියා හා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන
2. අවිධිමත් අංශයේරැකියා ප්‍රවර්ධනවැඩසටහන
3. රැකියා යෝග්‍යතාසංවර්ධන වැඩසටහන
4. රැකියා සමාජ වැඩසටහන

1. වෘත්තීය මාර්ගෝපදේශ තොරතුරු පද්ධති සැකසීම හා බෙදාහැරීම
2. වෘත්තීය මාර්ගෝපදේශඅධ්‍යනය හා පර්යේෂණ
3. වෘත්තීය . මාර්ගෝපදේශවැයත්මඩසටහන්ක්‍රි .ක කිරීම

1. වැඩසටහන් සැලසුම් කිරීමමෙහෙයවීම හා ඇගයීම
2. ක්ෂේත්‍ර වැඩසටහන්සම්බන්ධීකරණය
3. නව වැඩසටහන් හඳුනාගැනීම හා සැලසුම් කිරීම.

1. සාමාන්‍ය පරිපාලනය
2. කාර්ය මණ්ඩල හා ආයතන කටයුතු
3. දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන කටයුතු
4. ගබඩා සේවය
5. සුභසාධන කටයුතු

1. වාර්ෂික සැලසුම්සැකසීම හා වාර්තාසැකසීම.
2. කාර්ය මණ්ඩල සංවර්ධනය
3. ප්‍රගති ඇගයීම් කටයුතු
4. අනෙකුත් අංශ අතර සම්බන්ධීකරණය
5. දෙපාර්තමේන්තුප්‍රකාශන

1. ශ්‍රම වෙළඳපොළප්‍රවනතා අධ්‍යනය
2. ශ්‍රම වෙළඳපොළතොරතුරු එකතු කිරීම
3. විශ්ලේෂණයකිරීම හාබෙදාහැරීම

1. මිනිස්බලය පුරෝකථනයකිරීම.
2. ආංශික මිනිස්බල සැලසුම්සැකසීම
3. අදාළ ආයතන සමඟසම්බන්ධීකරණය මඟින් සැලසුම්ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතුකිරීම
4. මිනිස්බල සංවර්ධනයසඳහා ආදාළ ප්‍රතිපත්තිහා යෝජනා ක්‍රමසැකසීම හා ක්‍රියාත්මක කිරීම

1. ජාතිකරැකීරක්ෂා සේවාජාලයක් සැකසීමහා ක්‍රියාත්මකකිරීම
2. රැකියාසේවාසපයන ආයතනඅතරසම්බන්ධීකරණය
3. රැකියා පොළ

1. දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණ කටයුතු

## 2.1 අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු 2016.12.31

| අනු අංකය | තනතුර | අදාළ වන සේවය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී.ලං.ප.සේ (විශේෂ) | 1 | 1 | 0 |
| 2 | අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී.ලං.ප.සේ I | 1 | 0 | 1 |
| 3 | අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ හාවෘත්තීය මාර්ගෝපදේශ අංශය) | ශ්‍රී.ලං.ප.සේ I | 1 | 1 | 0 |
| 4 | අධ්‍යක්ෂ (මිනිස්බල සැලසුම් හාපර්යේෂණ අංශය) | ශ්‍රී.ලං.ප.සේ I | 1 | 1 | 0 |
| 5 | ප්‍රධාන ගණකාධිකාරී | SLAcS I | 1 | 1 | 0 |
| 6 | ස.අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී.ලං.ප.සේ II/III | 2 | 1 | 1 |
| 7 | ස.අධ්‍යක්ෂ (මිනිස්බල සැලසුම් හාපර්යේෂණ අංශය) | ශ්‍රී.ලං.ප.සේ II/III | 2 | 1 | 1 |
| 8 | ස.අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ හාවෘත්තීය මාර්ගෝපදේශ අංශය) | ශ්‍රී.ලං.ප.සේ II/III | 2 | 1 | 1 |
| 9 | ස.අධ්‍යක්ෂ (මිනිස්බල සැලසුම් හාපර්යේෂණ අංශය) | ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III | 1 | 1 | 0 |
| 10 | ස.අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ හාවෘත්තීය මාර්ගෝපදේශ අංශය) | ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III | 1 | 1 | 0 |
| 11 | පරිපාලන නිලධාරී | රා.කළ.සේ.අධි | 1 | 0 | 1 |
| 12 | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය I/II | 1 | 0 | 1 |
| 13 | වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් | ආශ්‍රිත සේවය | 85 | 33 | 52 |
| 14 | ව්‍යාපෘති නිලධාරීන් | ආශ්‍රිත සේවය | 3 | 3 | 0 |
| 15 | මානව සම්පත් සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවය | 570 | 488 | 82 |
| 16 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.කළ.සේ I/II/II | 15 | 14 | 1 |
| 17 | රියදුරු | රියදුරු සේවය | 8 | 7 | 1 |
| 18 | කාර්යාල කාර්ය සහයක | කාර්යාල කාර්ය සහයක සේවය II/III | 7 | 4 | 3 |
|  | එකතුව |  | **703** | **558** | **145** |

## 2.2 මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරින්ගේ තොරතුරු සාරාංශය - 2016

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව | ප්‍රාදේශීය මට්ටමින් අනුයුක්ත සංඛ්‍යාව | දිස්ත්‍රික්ක මට්ටමින් අනුයුක්ත සංඛ්‍යාව | මුළු සංඛ්‍යාව | ප්‍රාදේශීය මට්ටමින් පුරප්පාඩු | දිස්ත්‍රික් මට්ටමින් පුරප්පාඩු | අතිරික්ත සංඛ්‍යාව | මුළු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| අම්පාර | 19 | 20 | 6 | 26 | 0 | 0 | 1 | 0 |
| අනුරාධපුර | 22 | 16 | 7 | 23 | 6 | 0 | 0 | 6 |
| බදුල්ල | 15 | 10 | 3 | 13 | 5 | 0 | 0 | 5 |
| මඩකලපුව | 14 | 14 | 8 | 22 | 0 | 0 | 0 | 0 |
| කොළඹ | 13 | 12 | 5 | 17 | 1 | 0 | 0 | 1 |
| ගාල්ල | 19 | 22 | 12 | 34 | 0 | 0 | 3 | 0 |
| ගම්පහ | 13 | 16 | 12 | 28 | 0 | 0 | 3 | 0 |
| හම්බන්තොට | 12 | 12 | 16 | 28 | 0 | 0 | 0 | 0 |
| යාපනය | 15 | 14 | 7 | 21 | 1 | 0 | 0 | 1 |
| මහනුවර | 20 | 20 | 14 | 34 | 1 | 0 | 0 | 1 |
| කෑගල්ල | 11 | 13 | 12 | 25 | 0 | 0 | 2 | 0 |
| කළුතර | 14 | 14 | 12 | 26 | 0 | 0 | 0 | 0 |
| කුරුණෑගල | 30 | 36 | 13 | 49 | 0 | 0 | 6 | 0 |
| මාතර | 16 | 18 | 13 | 31 | 0 | 0 | 2 | 0 |
| මාතලේ | 11 | 9 | 9 | 18 | 2 | 0 | 0 | 2 |
| මොණරාගල | 11 | 11 | 6 | 17 | 0 | 0 | 0 | 0 |
| නුවර එළිය | 5 | 4 | 1 | 5 | 1 | 0 | 0 | 1 |
| පුත්තලම | 16 | 13 | 4 | 17 | 4 | 0 | 0 | 4 |
| පොළොන්නරුව | 7 | 5 | 4 | 9 | 2 | 0 | 0 | 2 |
| රත්නපුර | 17 | 18 | 6 | 24 | 0 | 0 | 1 | 0 |
| ත්‍රිකුණාමලය | 11 | 7 | 5 | 12 | 4 | 0 | 0 | 4 |
| වවුනියාව | 4 | 4 | 2 | 6 | 0 | 1 | 0 | 1 |
| මන්නාරම | 5 | 3 | 2 | 5 | 2 | 0 | 0 | 2 |
| කිලිනොච්චි | 4 | 3 | 5 | 8 | 1 | 0 | 0 | 1 |
| මුලතිව් | 6 | 0 | 2 | 2 | 6 | 0 | 0 | 6 |
| එකතුව | **330** | **314** | **186** | **500** | **36** | **1** | **18** | **37** |

## 3. පාලන අංශය

පාලන අංශය යටතේ පහත සඳහන් ඒකකයන් ස්ථාපිත කර ඇත.

i. ආයතන අංශය
ii. සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය

දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටු කිරීම උදෙසා අභ්‍යන්තර පාලන ක්‍රියාවලියට දායක වීම තුලින් විශිෂ්ඨ කාර්ය සාධනයක් ළඟා කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ ඉහළ කළමණාකාරිත්වයට සහය වීම පිණිස ආයතන කටයුතු හා සාමාන්‍ය පරිපාලන කටයුතු මෙහෙයවීම ඇගයීම හා නංවාලීම පාලන අංශය වෙත පැවරී ඇති මූලික කර්තව්‍යයකි. ඊට අමතරව දෙපාර්තමේන්තුවේ ගුණාත්මක භාවය පවත්වා ගැනීම සඳහා ප්‍රයෝජනවත් භෞතික අභිමතාර්ථයන්ට හා කාර්යයන්ට ගැළපෙන උසස් තත්ත්වයක් සහිත සේවක මණ්ඩලයක් පවත්වා ගැනීම, අංශ අතර මනා විධිමත් සම්බන්ධීකරණයක් ඇතිකර ගැනීම, කාර්යය මණ්ඩලයේ සුභ සාධන පහසුකම් නංවාලීම හා සෙසු අංශයන් සඳහා අවශ්‍ය සහායක සේවා සැපයීම ද පාලන අංශය මඟින් සිදු කරනු ලබයි.

### 3.1 කාර්ය මණ්ඩල තොරතුරු

#### 3.1.1 මාණ්ඩලික නිලධාරින් අළුතින් බඳවා ගැනීම

| අනු අංකය | නම | තනතුර | සේවයට පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | ඊ.එල්.කේ.දිසානායක මයා | අධ්‍යක්ෂ (පාලන) | 2016.02.02 |

#### 3.1.2 මාණ්ඩලික නිලධාරින් ස්ථාන මාරු වීම්

මෙම වර්ෂය තුළ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ගේ ස්ථාන මාරු වීම් සිදු වී නොමැත.

### 3.2 කාර්ය මණ්ඩලය පුහුණුව

මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා 2016 වර්ෂයේදී පහත සඳහන් පුහුණු වැඩසටහන් සඳහා යොදවා ඇත.

| අනුඅංකය | පාඨමාලාවේ/වැඩසටහනේ නම | පැවැත්වූ දිනය | වියදම |
|---|---|---|---|
| 1 | Certificate course in English for employment purposes Batch II | 2016.01.17 | 50,000.00 |
| 2 | ඉගෙනුම් දුබලතා සහිත ළමයින්ට ඉගැන්වීම පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව | 2016.02.29 | 16,000.00 |
| 3 | මනෝවිද්‍යාත්මක පුහුණු වැඩමුළුව | 2016.06.06 | 3800.00 |
| 4 | වෘත්තීය මාර්ගෝපදේශනය දෙදින පුහුණු වැඩමුළුව | 2016.06.20 | 72,000.00 |
| 5 | නායකත්ව පුහුණු වැඩමුළුව | 2016.04.02,03 හා 2016.05.13,14 | 816,000.00 |

| | | | |
|---|---|---|---|
| 6 | ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සමාජ විද්‍යාව) | 2016.01.11 | 34,750.00 |
| 7 | Post-Graduate Diploma of Counselling | 2016.03.01 | 225,000.00 |
| 8 | ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (ආර්ථික විද්‍යාව) | 2016.03.01 | 50,000.00 |
| 9 | ඉහළ ශ්‍රම ඵලදායිතාව සඳහා කාර්යාල කාර්යය සහායක කාර්යය භාරය | 2016.07. 12 | 12,000.00 |
| 10 | Forecasting Techniques පුහුණු පාඨමාලාව | 2016.01.26 | 150,000.00 |
| 11 | තොරතුරු තාක්ෂණයට අදාළව භාණ්ඩ ප්‍රසම්පාදනය සහ ඇගයීම පිළිබඳ වැඩමුළුව | 2016.03.14 | 8,500.00 |
| 12 | කාර්යාල ක්‍රම සහ ලිපි ගොනු කළමනාකරණය | 2016.08.08 | 180,000.00 |
| 13 | රියදුරු පුහුණු වැඩසටහන | 2016.07.21 - 2016.08.03 | 15,000.00 |
| 14 | Advance Time Series Forecasting පුහුණු පාඨමාලාව | 2016.08.25 | 70,000.00 |
| 15 | National Diploma in Career Guidance – 2016 - 2017 | 2016.09.21 | 37,500.00 |
| 16 | ගම් මට්ටමින් නව ව්‍යවසායකයින් බිහි කිරීමේ පුහුණු වැඩසටහන | 2016.09.26 | 12,500.00 |
| 17 | ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවේ 02 වන හා 03 වන අදියරයන් සඳහා ගෙවීම | 2016.11.01 | 50,000.00 |
| 18 | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 2016 - 2017 | 2016.11.09 | 35,000.00 |
| 19 | කාර්යාල ක්‍රම සහ ලිපිගොනු කළමනාකරණය | 2016.11.06 | 1,800.00 |

**3.4 මූල්‍ය පරිපාලන සාරාංශය - 2016**

**වැය ශීර්ෂය - 328**

| | ප්‍රතිපාදනය(රු .000) | වියදම(රු .000) | ඉතිරිය(රු .000) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 330,450 | 328,829 | 1,621 |
| ප්‍රාග්ධනවියදම | 33,700 | 31,738 | 1,962 |
| **එකතුව** | **364,150** | **360,567** | **3583** |


## 4. රැකියා නිර්මාණ හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය

යෞවන රැකියා අංශය ලෙස 1997 වර්ෂයේ දී යෞවන කටයුතු අමාත්‍යාංශයට යටතේ ආරම්භ කරන ඇති මෙම අංශය 2010 වර්ෂයේදී මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව පිහිටුවීමේදී දෙපාර්තමේන්තුව යටතට පත් කර ඇත.

වෘත්තීය මාර්ගෝපදේශ හා රැකියා නිර්මාණ, ප්‍රවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරන විවිධ, එකිනෙක යා වූ වැඩසටහන් මාලාවක් තුලින් සමස්ථ ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය නිසි වෘත්තීන් කෙරේ යොමු කරවීම, නව රැකියා අවස්ථාවන් නිර්මාණය කිරීම මෙන්ම ජාතික ප්‍රතිපත්ති හා පුද්ගල හැකියා හා දක්ෂතාවයන්ට අනුකූල රැකියාවන් ප්‍රවර්ධනය කිරීමත් යන පුළුල් පරාසයක පැතිරුණ කාර්යය භාරයක් ඉටු කරනු ලබයි.

මෙම කාර්යභාරය සාර්ථකව ඉටු කිරීම සඳහා අංශය ඒකකක දෙකකට බෙදා ඇති අතර, ඒ ඒ ඒකකය සහකාර අධ්‍යක්ෂවරයකුගේ මග පෙන්වීම යටතේ මෙම කාර්යයන්හි නිරත වේ. ශ්‍රී ලංකාව පුරා දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇති වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් හා සංවර්ධන නිලධාරී මගින් මෙම වැඩසටහන් බිම් මට්ටම කරා රැගෙන යාම සිදු වේ.

**විරැකියාවෙන් පෙළෙන හා නවයාලෙස රැකියා වෙළඳපල වෙත ප්‍රවේශ වන හා අනාගතයේ ප්‍රවේශ වීමට නියමිත ජනතාව වෙත සේවා නියුක්ති ආශ්‍රිත පහසුකම් සැපයීමේ අරමුණින් 2016 වසරේ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විවිධ වැඩසටහන් පවත්වන ලදි.**



### 4.1 රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

2016 වසරේ ජනවාරි සිට දෙසැම්බර් අවසානය දක්වා වූ කාලයතුළ ක්ෂේත්‍රය තුළ පවත්වන ලද රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත.

| වැඩසටහනේ නම | ඇස්තමේන්තුව රු .මිලියන | වියදම රු .මිලියන | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය | |
| ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන | 0.71 | 0.6816 | 25 | 53 | 1818 |
| රැකියා සමාජ වැඩසටහන | 0.85 | 0.8389 | 25 | 25 | 750 |
| රැකියා 100 වැඩසටහන | 0.59 | 0.4035 | 10 | 13 | 2076 |
| අවශ්‍යතා මත පුහුණු වැඩසටහන | 2.17 | 2.1730 | 219 | 328 | 9670 |
| උද්‍යාන අලංකරණ වැඩසටහන | 0.094 | 0.0778 | 3 | 3 | 100 |
| නිදහස් රැකියා ප්‍රවර්ධන වැඩසටහන | 0.087 | 0.0997 | 6 | 10 | 308 |
| සංචාරක ක්ෂේත්‍රයේ රැකියා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 0.1662 | 0.1148 | 6 | 5 | 261 |
| අවධානමට ලක් වූවන් රැකියාගත කිරීමේ වැඩසටහන | 0.1987 | 0.1988 | 25 | 22 | 918 |
| ව්‍යවසායකත්ව අලෙවි ප්‍රදර්ශනය | | | | 2 | - |
| විශේෂ වැඩසටහන් | | 0.5437 | | 46 | 1740 |
| **එකතුව** | **4.8659** | **5.1318** | **319** | **507** | **17,641** |

## 4.2 වෘත්තීය මාර්ගෝපදේශ අංශය

වෘත්තීය මාර්ගෝපදේශනය ⟷ වෘත්තීය උපදේශනය ⟷ සේවා නියුක්ති උපදේශන

වෘත්තීය මාර්ගෝපදේශනය පුද්ගලයින්ගේ වෘත්තීය ජීවිතය හා එහි සංවර්ධනය සාර්ථකව කළමනාකරණය කර ගැනීම සඳහා ඉවහල් වේ. රැකියාලාභීන් තුළ ආකල්ප වර්ධනය , උත්ප්‍රේරණය සහ අවශ්‍ය දැනුම දියුණු කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේදී වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පවත්වන ලදි. 2016 වසරේ ජනවාරි සිට දෙසැම්බර් අවසානය දක්වා වූ කාලය තුළ ක්ෂේත්‍රය තුළ පවත්වන ලද වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත.

| වැඩසටහනේ නම | ඇස්තමේන්තුව රු .මිලියන | වියදම රු .මිලියන | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය | |
| අ.පො.ස. සාමාන්‍ය පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 0.93 | 0.8707 | 1951 | 2274 | 66048 |
| අ.පො.ස. උසස් පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 0.80 | 0.7824 | 1471 | 1438 | 42553 |
| ස්වයං රැකියා පෙළඹවීම් වැඩසටහන | 0.20 | 0.1720 | 60 | 139 | 4219 |
| වෘත්තීය අභියෝග ජය ගැනීම | 0.53 | 0.5124 | 60 | 81 | 2795 |
| උපාධි අපේක්ෂිතයින් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන ( අභ්‍යන්තර ) | 0.46 | 0.2758 | 12 | 8 | 317 |
| උපාධි අපේක්ෂිතයින් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන ( බාහිර ) | 0.46 | 0.5328 | 12 | 17 | 1066 |
| ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 1.05 | 0.8829 | 35 | 48 | 1624 |
| දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන | 0.68 | 0.4262 | 150 | 290 | 14370 |
| වෘත්තීය මංපෙත් | 0.19 | 0.1437 | 08 | 12 | 2535 |
| හසර සඟරාව මුද්‍රණය | 0.50 | 0.3185 | 04 | 02 | |
| **එකතුව** | **5.8** | **4.9174** | **3,763** | **4,309** | **135,527** |

## 5. මිනිස්බල සැලසුම් හා සංවර්ධන හා පර්යේෂණ අංශය

### 5.1 ශ්‍රම වෙළඳපල තොරතුරු ඒකකය

ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළ ජාලයේ ශ්‍රී ලාංකික කොටස්කරුවා වශයෙන් කාර්යක්ෂම හා ඵලදායී තීරණ ගැනීම සඳහාත්, ප්‍රතිපත්ති සම්පාදන කාර්යය සඳහාත් අවශ්‍ය ශ්‍රම වෙළඳපොළ තොරතුරු භාවිතයට පහසු වන ආකාරයෙන් සියළු පාර්ශ්වකරුවන් වෙත සම්පාදනය කර දීම උදෙසා බිහිකරන ලද අංශයයි.

| අනු අංකය | යෝජිත වූ වැඩ සටහන් | කළ වැඩ සටහන් | ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | රැකියා පැතිකඩ සැකසීම<br>• සෞඛ්‍යක්ෂේත්‍රයේරැකියාපැතිකඩ | රැකියා පැතිකඩ සැකසීම<br>• සෞඛ්‍යක්ෂේත්‍රයේරැකියාපැතිකඩ | 100 % |
| | • වරායහානාවික ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ | • වරායහානාවික ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ | 100 % |
| 02 | දිස්ත්‍රික් මට්ටමේ රැකියා ගතවන්නන්ගේරැකියා යෝග්‍යතාවය මැනීම<br>• කළුතරදිස්ත්‍රික්කය | දිස්ත්‍රික් මට්ටමේ රැකියා ගතවන්නන්ගේ රැකියා යෝග්‍යතාවය මැනීම<br>• කළුතරදිස්ත්‍රික්කය | 100 % |
| | • බදුල්ල දිස්ත්‍රික්කය | • බදුල්ල දිස්ත්‍රික්කය | 75 % |
| | • මඩකලපුව දිස්ත්‍රික්කය | • මඩකලපුව දිස්ත්‍රික්කය | 85 % |
| | • වව්නියාව දිස්ත්‍රික්කය | • වව්නියාව දිස්ත්‍රික්කය | 90 % |
| | • මන්නාරම දිස්ත්‍රික්කය | • මන්නාරම දිස්ත්‍රික්කය | 80 % |
| | • ගාල්ල දිස්ත්‍රික්කය | • ගාල්ල දිස්ත්‍රික්කය | 65 % |
| 03 | අවිධිමත් අංශයේ රැකියා ගත වන්නන් පිළිබඳ අධ්‍යයනය | අවිධිමත් අංශයේ රැකියා ගත වන්නන් පිළිබඳ අධ්‍යයනය | 100 % |
| 04 | සමාජ ආර්ථික දත්ත අත් පොත | සමාජ ආර්ථික දත්ත අත් පොත | 95 % |
| 05 | පුවත්පත් දැන්වීම් පදනම් කර ගත් රැකියා ඉල්ලුම පිළිබඳ විශ්ලේෂණය කිරීම | පුවත්පත් දැන්වීම් පදනම් කර ගත් රැකියා ඉල්ලුම පිළිබඳ විශ්ලේෂණය කිරීම | 100 % |
| 06 | ශ්‍රම වෙළඳපොළේ පවතින රැකියා ඉල්ලුම හා සැපයුම අතර කුසලතා නොගැළපීම පිළිබඳ අධ්‍යයනය<br>• අධ්‍යාපනක්ෂේත්‍රය | ශ්‍රම වෙළඳපොළේ පවතින රැකියා ඉල්ලුම හා සැපයුම අතර කුසලතා නොගැළපීම පිළිබඳ අධ්‍යයනය<br>• අධ්‍යාපනක්ෂේත්‍රය | 100 % |
| | • ප්‍රවාහනක්ෂේත්‍රය | • ප්‍රවාහනක්ෂේත්‍රය | 100 % |
| | • නිෂ්පාදනක්ෂේත්‍රය | • නිෂ්පාදනක්ෂේත්‍රය | 85 % |
| | • තාක්ෂණක්ෂේත්‍රය | • තාක්ෂණක්ෂේත්‍රය | 80 % |

**5.2 මහජන රැකියා මධ්‍යස්ථාන (PES)**

රාජ්‍ය හා පුද්ගලික අංශවල හවුල් ව්‍යාපෘතියක් ලෙස අංක අමප/03/0874/130/23 EPD/464 හා 2003.10.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රැකී රක්ෂා සේවා මධ්‍යස්ථාන ජාලය (රැකියා පියස) 2003 වර්ෂයේදී ස්ථාපනය කරන ලදී. ජාතික රැකීරක්ෂා ප්‍රතිපත්තියේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කම්කරු සබඳතා හා රැකී රක්ෂා අමාත්‍යාංශය යටතේ මෙම ආයතනය පුළුල් පරාසයක් තුළ ළඟා විය හැකි පරිගණක පද්ධතියක් හරහා සියලු මධ්‍යස්ථාන එකිනෙකට සම්බන්ධ කරන ලදී. මුලින් විදේශ ආධාර ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වූ එය 2007.01.31 දක්වා ක්‍රියාත්මක විය. අනතුරුව කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යාංශය විසින් 2007.01.24 දින ඉදිරිපත් කල අංක 2/2007 අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා රැකියා පියස ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

2010 වර්ෂයේදී එම විෂය පථය කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ පිහිට වූ මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවට පැවරුණු අතර, ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා විසින් රැකියා පියස ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 03/2011 හා 2011.02.15 දිනැති සංදේශයට අනුව රැකියා පියස ව්‍යුහගත කිරීමට අදාළව ඉදිරිපත් කරන ලද කරුණු සඳහා 2011.05.12 දින තීරණය මඟින් අනුමැතිය ලැබී ඇත.

6/2011 අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලැබුණු තීරණ වලට අනුව Jobs Net ඇපයෙන් සීමිත සමාගම යටතේ පැවතුනු දිස්ත්‍රික් රැකියා පියස මධ්‍යස්ථාන මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව යටතට පවරා ගන්නා ලදී. ඉන් පසුව දෙපාර්තමේන්තුව යටතේ ඇති කරන ලද දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන වෙත රැකියා පියස මධ්‍යස්ථාන සතුව තිබූ භෞතික සම්පත් ද පවරා දෙන ලදී. මෙසේ පිහිටුවනු ලැබූ දිස්ත්‍රික් රැකියා සේවා මධ්‍යස්ථාන ක්‍රියාත්මක තත්ත්වයේ පවත්වා ගෙන යමින් දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගනිමින් මහජන රැකියා සේවාව සැපයීමට අදාළ කටයුතු ඉටු කරමින් පවතී.

**2016 වසරේ ජනවාරි සිට දෙසැම්බර්අවසානය දක්වා වූ කාලයතුළ මහජන රැකියා සේවා මධ්‍යස්ථානවල පවත්වන ලද භෞතික ප්‍රගතිය පහත දක්වා ඇත**

| දිස්ත්‍රික්කය | රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම | රැකියා පුරප්පාඩු ලියාපදිංචි කිරීම | රැකියා ගැලපීම් | රැකියා ගත කිරීම | පුහුණුව සඳහා යොමු කිරීම |
|---|---|---|---|---|---|
| අම්පාර | 3,982 | 339 | 186 | 146 | 149 |
| අනුරාධපුර | 751 | 669 | 819 | 225 | 135 |
| බදුල්ල | 538 | 1,171 | 1,549 | 84 | 89 |
| මඩකලපුව | 7,408 | 2,006 | 2,420 | 210 | 32 |
| කොළඹ | 2,456 | 3,574 | 3,352 | 460 | 83 |
| ගාල්ල | 2,456 | 413 | 1,403 | 271 | - |
| ගම්පහ | 1,251 | 2,000 | 1,271 | 359 | 15 |
| හම්බන්තොට | 1,681 | 1,010 | 1,413 | 261 | 173 |
| යාපනය | 281 | 1,912 | 2,231 | 494 | 10 |
| කළුතර | 1,475 | 1,836 | 626 | 270 | 291 |
| මහනුවර | 2,161 | 472 | 706 | 297 | 299 |
| කෑගල්ල | 3,995 | 2,901 | 956 | 371 | 30 |
| කිලිනොච්චි | 1,992 | 111 | 265 | 59 | 45 |
| කුරුණෑගල | 4,101 | 959 | 4,338 | 527 | 127 |
| මන්නාරම | 2,366 | 689 | 1,246 | 28 | 223 |
| මාතලේ | 382 | 423 | 256 | 185 | 118 |
| මාතර | 2,270 | 2,645 | 1,554 | 428 | 44 |
| මොණරාගල | 1,123 | 1,248 | 316 | 67 | - |
| පොළොන්නරුව | 1,225 | 521 | 474 | 64 | 250 |
| පුත්තලම | 1,056 | 496 | 495 | 140 | 35 |
| රත්නපුර | 3,875 | 1,125 | 3,241 | 879 | 362 |
| ත්‍රිකුණාමලය | 1,305 | 423 | 684 | 105 | 63 |
| වවුනියාව | 2,236 | 323 | 2,232 | 143 | 247 |
| මුලතිව් | 1,123 | 87 | 109 | 16 | - |
| **එකතුව** | **51,489** | **27,353** | **32,142** | **6,089** | **2,820** |

**රැකියාගත කිරීම**

⇩

**2820**

**5.3දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහනෙහි ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | සහභාගීවූසංඛ්‍යාව | වියදම |
|---|---|---|
| කළුතර- මතුගම | 1520 | 170,925.00 |
| බදුල්ල | 2178 | 204,308.90 |
| මඩකලපුව | 2201 | 483,753.87 |
| වවුනියාව | 1642 | 397,987.87 |
| මන්නාරම | 1264 | 409,669.87 |
| බදුල්ල - වැලිමඩ | 1348 | 92,100.00 |
| රත්නපුර | 2223 | 196,300.00 |
| **එකතුව** | **12,376** | **1,955,045.51** |






දිස්ත්‍රික් රැකියා පොළ - රත්නපුරය (2016.09.25) ධර්මපාල විද්‍යාලය



ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු
වැඩසටහන



කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2016.05.24 - 2016.05.27





රැකියා සමාජ වැඩසටහන - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
2016.06.27 - 2016.07.01





පාසල් වෘත්තීය මාර්ගෝපදේශ සාමාන්‍ය පෙළ වැඩසටහන




මන්නාරම උගිලන්කුලම රෝමානු කතෝලික දෙමළ මහා විද්‍යාලය - 2016.09.22




අවශ්‍යතා මත පුහුණු වැඩසටහන





කාත්තණ්කුඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - 2016/09/29 අලෙවිකරණය හා පොත් තැබීම

ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන





දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන විවෘත කිරීම
අම්පාර මහජන රැකියා සේවා මධ්‍යස්ථානය 2016/10/03





රත්නපුර මහජන රැකියා සේවා මධ්‍යස්ථානය - 2016.02.01




පොළොන්නරුව මහජන රැකියා සේවා මධ්‍යස්ථානය - 2016.07.29



මාතර මහජන රැකියා සේවා මධ්‍යස්ථානය 2016.12.10



මාතර මහජන රැකියා සේවා මධ්‍යස්ථානය 2016.12.10



රැකියා පියස වැඩසටහන පොළොන්නරුව - සැප්තැම්බර් 20 - 23 දක්වා





බාහිර උපාධි අපේක්ෂිතයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන
යාපනය ඔක්තෝම්බර් 17 - 19 දක්වා



දෙමාපිය දැනුවත් කිරීමේ වැඩසටහන
ආරච්චිකට්ටුව ප්‍රා.ලේ.කා - 2016.11.21



වෘත්තීය අභියෝග ජය ගැනීමේ වැඩසටහන
කිලිනොච්චිය - 2016.10.04

# මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
# மனிதவலு மற்றும் வேலைவாய்ப்புத் திணைக்களம்
# Department of Manpower & Employment

2010.02.12 දිනැති අංක 1640/31 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව 2010 වසරේදී කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදි. වර්තමානයේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුව වෙත රාජ්‍ය රැකියා සේවාවන් පවත්වාගෙන යාම හා ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම ද පැවරී ඇත.

2010 பெப்ரவரி 12 ஆம் திகதி 1640/31 ஆம் இலக்க அதி விசேட வர்தமானி அறிக்கை மூலம் மனித வலு மற்றும் வேலை வாய்ப்புத் திணைக்களம் 2010 ஆம் ஆண்டில் தொழில் தொடர்வுகள் மற்றும் மனிதவலு அமைச்சின் கீழ் ஸ்தாபிக்கப்பட்டது. தற்போது தொழிலாளர் மற்றும் தொழில் சங்கம் உறவுகள் அமைச்சின் கீழ் இயங்குகின்ற திணைக்களத்திடம் அரச தொழில் சேவைகள் நடாத்திப் போகுதல் மற்றும் தேசிய மனித வளங்கள் மற்றும் தொழில்கொள்கைகளின் ஏற்பாடுகள் செயற்படுத்தும் பொறுப்பும் வழங்கப்பட்டுள்ளது.

Department of Manpower and Employment was established with effected from 1st January 2010 under the Ministry of Labour Relations and Manpower, in terms of the special Gazette Extraordinary no 1640/30 on 12th February 2010 and conveyed the responsibilities to implement the provisions of National human resource & job policies and conducting State job servicers to the Department which is operating under the Ministry of Labour and Union affairs in present.

PRINTEC - 0112 815 816

**Department of Manpower & Employment,**
9th Floor, Sethsirirpaya (Second Phase),
Battaramulla.